චමත්කාර ජායාරූපකරණය, අතිශය සියුම් රූපමය ගැබ් ගන්නාරය ඉර මැදියම් මොස්ට්‍රියල් සිනමා උළෙලේ තිරගත වූ විශිෂ්ටතම චිත්‍රපට අතරින් එකක් බවට පත් කරයි

අන්තර්ජාතික විචාරක වෙබ් අඩවිය ඉර මැදියම හැඳින්නුවේ එසේ ය.

ප්‍රසන්න විතානගේ ගේ ඉර මැදියම චිත්‍රපටයේ මානුෂිකත්වය සහ එහි ප්‍රධාන

නොලැබෙන සාමාන්‍ය මිනිසුන්ගේ කතන්දරය ඔබට ඉදිරිපත් කරන්නට.

මෙහි තිර රචනය ගොඩ නගන්නට වසර දෙකක් අපට ගියා. අපට අවශ්‍ය වුණා මේ සියලු සිදුවීම් ස්වභාවික ආකාරයෙන්ම රූපත ගත කරන්න. අපට දැනුණා මේ චිත්‍රපටයට විශාල අතිරේක නළු නිළි යන් සංඛ්‍යාවක් අවශ්‍ය වන බව. මේ අතිරේක නළු නිළියන් අතරට තරු වශයෙන් අප හඳුනන ශිල්පීන් යොදා ගන්නොත් එහි පිළිවෙතයිත්වයට බාධා වෙන බව අපට පෙනුණා. මේ නිසා

නොපෙනෙන මානයෙන් ඔබ්බට

නළු නිළි යුවළගේ රංගනය සිසා එය විචාරකයන් අතර ජනප්‍රිය ත්‍රිපටයක් බවට පත් විය. ඉන්දියානේ සිනා මාලා සඳරාවේ ගොනුල් කොළින් එසේ ලිව්වේ ය.

ශ්‍රී ලංකාවේ ස්ථාන තුනකදී එකම ඇවස්ථාවේ සිදුවන සිදුවීම් තුනක් හෝමා කර ගනිමින් තැනූ ඉර මැදියම මේ වන විට එංගලන්තයේ චැනල් 4 රූපවාහිනිය විසින් මිළට ගෙන ඇති අතර කැනඩාවේ සිනමාහල් ගණනාවක් ප්‍රදර්ශණය වීය

ඉර මැදියම පිළිබඳ එහි අධ්‍යක්ෂක වරයා වන ප්‍රසන්න විතානගේ මෙසේ පැවසී ය.

"ඉර මැදියම චිත්‍රපටයට තන්තනට අඩිතාලම වැටෙන්නෙ 1999 දී එවකට තිබූ රජය මගින් මා තැනූ පුර හඳ කළුවර චිත්‍රපටය තහනම් කිරීමත් සමගයි. මෙහිදී මට ඉඩ කඩක් ලැබුණා අළුත් චිත්‍රපටයක් ගැන හිතන්න. මේ අතරවාරයේ තමයි ඉර මැදියමට අදාල වුණ කතාන්තර වලට අදාල සිද්ධීන් තුන මට දැනගන්නට ලැබෙන්නෙ. මේ සිදුවීම් අසන විට මගේ සිත් ගත් කාරණයක් තිබෙනවා. බොහෝ විට සමාජ විපරීධාස ගැන කතා කරනවිට ඒවා සාමාන්‍ය මිනිසුන්ගේ ජීවිත වලට බලපාන්නෙ මොකොමද කියන කාරණය

මග හැරෙනවා වීවිධ දේශපාලන මත වාද වල එල්ල ගෙන ඒ දෙස බලන හිසා. ඉර මැදියම තුලින් මට ඉඩ කඩ ලැබෙනවා අපෙන් මග හැරෙන සහ බොහෝ දෙනාට අසන්නට අපි අළුත්ම මුහුණු රැසක් යොදා ගත්තා.

මේ හලු හිසියන් සඳහා අපි අවුරුද්දක වැඩ මුළුවක් ක්‍රියාත්මක කළා. එතිත් ඔවුන්ට කරමරාව ඉදිරියේ ස්වභාවිකව හැසිරෙන ආකාරය පුහුණු කෙරුණා."

ඉර මැදියම් ඔබ වන විට අන්තර්ජාතික සම්මාන පහක් දිනා ගැනීමෙන් එහි සාර්ථකත්වය සනිටුහන් කර ඇත. සමන් ගුණවර්ධන චරිතය සඳහා ලෝරාගත් පීටර් අලේමීදා සිය චරිතයට සාධාරණයය ඉටු කර ඇති බව පැහැදිලි ය. තමාගේ අභිමි වූ සැමියා සොයා යන වමර් ලෙස රඟපාන හිමිමි හරස්ගම ලොව පුරා විචාරක පැසසුමට පාත්‍ර වූවා ය.

හළු හිසියන් සිළුබලව කතා කරද්දී ප්‍රසන්න මෙසේ කීවේ ය.

ඇරගත් ගේ චරිතය සඳහා සුදුසු ළමා හලුවෙක් සොයා ගැනීම අපට විශාල ප්‍රශ්නයක් වුණා. ඇරගත් ගේ චරිතයට අප තෝරා ගත් මොහොමඩ් රෆියුල්ලා කල්පිටියේ අතාර කඳවුරකදී අපට හමු වූ දරුවෙක්. රෆියුල්ලා සිංහල දැන හිටියේ නැහැ. ඒ නිසා භාෂා පරිවර්තකයකු ලෙස අප ට උපකාර කළ මන්සූර් මහතා චිත්‍රපටයේ හසන්ගේ චරිතයට සුදුසු වඩ මට වැටහුණා.

ප්‍රසන්න විතානගේ ට නවවන සවන් දෙමු.

"අද බොහෝ දෙනෙක් අතන ප්‍රශ්නයක් තමයි කතා කෘතියකින් යම් සමාජ සංවාදයක් ආරම්භ කළ හැකිද යන්න. ඉර මැදියම තුලින් යම් සංවාදයක් ඇති වී තිබෙන බව අපට දේනවා.. මේ චිත්‍රපටයෙන් මා කතා කරන කාරණයට ඔබ එකඟ වෙන්න පුළුවන් හොවෙන්න පුළුවන්. හමුත් වැදගතුත් දේ අපි කිසියම් ආකාරයක හැඟීමක් කිසියම් ආකාරයක සසල කිරීමක් ඇති කරන්නට සමත් වෙලා තියෙනවා. සිනමා කාරයෙක් හැටියට මට එය හොඳටම ප්‍රමාණවත්"

■

තුන් වන පිටෙන් අනිරිය

පිරිහමන්නටත් සූදානම් බව ඇය ඉගිකොට තිබිණ. එක්සත් ජාතික පක්ෂය එම යෝජනාව ප්‍රතික්ෂේප කොට තිබේ.

මෙම තත්වය තුළ මේ දිනවල රටේ බහුතරය නගන ප්‍රශ්නය ඇය ද තම සිතින් තබනු ඇත. එම ප්‍රශ්නය වන්නේ දන් මොකක් ද ජනාධිපතිනිය කරන්න යන්නේ? යන්න ය.

වැැැදි දේශපාලන තීන්දුවක් ගෙන රටේත් ජනතාවගේත්, අනාගතය අඳුරේ ගෙලූ ජනාධිපතිනිය දන් යළිත් එවැනි ම වැැැදි දේශපාලන තීන්දුවක් ගැනීමට සූදානම් වන බව දනගන්නට තිබේ.

ඇය ජවිපෙට පහර දුන්නේ තම පක්ෂය බේරා ගැනීම සඳහා වුව ද ඇයගේ මෙම තීරණයත් සමග ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කැවී බිඳී යෑමට ගෝ නැත්තක නැතිවී යන්නට වුව හැකි ය.

දනට ශ්‍රී ලංකාවේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජන්ද්‍රයේ පත්වන ජනාධිපතිවරයාට එම ධූරයට පත්වීය හැක්කේ දෙවරක් පමණකි. ඒ අනුව ජනාධිපතිනිය දන් සිටින්නේ ඇයගේ

රටේ ඇති පොදු මතය වන්නේ මිළඟ ජනාධිපති අපේක්ෂකයා මහින්ද රාජපක්ෂ වීය යුතු බව ය. මේ මතය කොතරම් ප්‍රබල ද යන්න ඔහු සමග තරග කොට ජය ගැනීමට රනිල් වික්‍රමසිංහට නොහැකි වනු ඇතැයි එක්සත් ජාතික පක්ෂ නායකයන්ගේ ද මතය වී තිබේ.

දෙවැනි ධූර කාලයේ ය. එය මේ වසරේ දෙසැම්බර් මාසයෙන් අවසන් වීය යුතුව ඇතත්, ඇයගේ අපේක්ෂාව එහන වසරේ ද ජනාධිපති ධූරයේ රැඳී සිටින්නට ය. ව්‍යවස්ථාවට අනුව ජනාධිපති ධූරයෙන් විශ්‍රාම ගත් පසු ඇයට යළි ක්‍රියාකාරී දේශපාලනයේ නිරත වීය නොහැක. ඒ අනුව ඇය පක්ෂනායකත්වයෙන්ද ඉවත් වීය යුතු ය.

පසුගිය වසරේ පිට ම ඇය පෙන්නුම් කළේ එලෙස කටයුතු කරන්නට ඇය සූදානම් නොමැති බව ය. 2004 සන්ධාන ආණ්ඩුව බලයට පත්වූ පසු ඇයගේ දුක්සහිතය වූයේ යළිත් වරක් ජනාධිපති පදවියට පත්වීමට ය. එය නොහැකි නම්, ව්‍යවස්ථාව වෙනස් කොට, විධායක ජනාධිපති ධූරය අහෝසි කොට පූර්ණ බලැති අමාත්‍රි ලෙසින් පාර්ලිමේන්තුවට එන්නට ය. සන්ධානයේ මිළඟ ජනාධිපති අපේක්ෂකයා කවුරුන්දැයි නම් නොකළේ ද මේ නිසා ය.

කෙසේ වෙතත් රාජ්‍ය නොවන සංවිධාන මාලියාවේ බලපෑමට යටත්ව යාන්ත්‍රණ ගිවිසුමක් ඇති කිරීම නිසා ආණ්ඩුව කැවී යෑමෙන් ඇයගේ එම සිහිනය ගිඳී ගොස් තිබේ. දන් ඇයට අවශ්‍ය අවම වශයෙන් පක්ෂ නායකත්වය හෝ රැක ගන්නට ය. එසේත් නොහැකි නම් බණ්ඩාරනායක කෙනෙකු පක්ෂ නායකත්වයට පත් කරන්නට ය.

ඒ අනුව, තම සොහොයුරා, අනුර බණ්ඩාරනායක මිළඟ ජනාධිපති අපේක්ෂක ලෙස නම් කිරීමේ උත්සාහයක ජනාධිපතිනිය යෙදී සිටින බව දනගන්නට තිබේ. අනුර බණ්ඩාරනායක ජනාධිපතිවරයෙන් ජය නොලදහ බව ඉතා පැහැදිලි වුව ද ඇයට අවශ්‍ය අනුරව පක්ෂ නායකත්වය භාර දෙන්නට බව ඉතා පැහැදිලි ය. ඇයට අනුර බණ්ඩාරනායකට පක්ෂ නායකත්වය සහ රටේ නායකත්වය දෙන දෙන්නට අවශ්‍ය වූයේ නම් ඒ සඳහා විපක්ෂ නායකකමට මහින්ද රාජපක්ෂ නම් කරන අවස්ථාවේ සිට කටයුතු කළ යුතුව තිබිණ. එහෙත් ඇය එලෙස කටයුතු නොකළේ රටේ නායකත්වය හා පක්ෂ නායකත්වය තමන් සතුකර ගැනීමේ අභිප්‍රාය ඇය තුළ තිබූ බැවිනි.

විපක්ෂ නායකකමට පත්වූ මහින්ද රාජපක්ෂ,

පසුව අගමැති ධූරය ද ලබා ගත්තේ ය. අගමැති ධූරය දරූ වසරක තරම් කෙටි කාලය තුළ මහින්ද ජනාධිපති අපේක්ෂකයා විම සඳහා වන 'ජනප්‍රිය' සුදුසුකම් එක් රැස්කර ගෙන තිබේ. එනිසා රටේ ඇති පොදු මතය වන්නේ මිළඟ ජනාධිපති අපේක්ෂකයා මහින්ද රාජපක්ෂ විය යුතු බව ය. මේ මතය කොතරම් ප්‍රබල ද යන්න ඔහු සමග තරග කොට ජය ගැනීමට රනිල් වික්‍රමසිංහට නොහැකි වනු ඇතැයි එක්සත් ජාතික පක්ෂ නායකයන්ගේ ද මතය වී තිබේ. මුල දී ජවිපෙ සමග එතරම් ඇයි නොඳයියක් නොතිබූ මහින්ද මේ වන විට එම බාධකය ද ජය ගෙන තිබේ. ඒ ජවිපෙ සහාය නොමැතිව තමන්ට ජනාධිපති විමට හෝ ශ්‍රීලනිපයට ආණ්ඩුවක් ලබා ගැනීමට නොහැකි බව ඔහු දන්නා බැවිණි.

එවන් වටපිටාවන් තුළ අනුර බණ්ඩාරනායක ජනාධිපති අපේක්ෂකයා ලෙස නම් කළහොත් ඇතැම් විට පක්ෂය දෙකට බෙදීමක් පවා ඇතිවිය හැක. මේ අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉදිරි පෙළේ අයට දන් ඇත්තේ අස්ථාවර වී ඇති ආණ්ඩුව ශක්තිමත් කර ගන්නේ කෙසේ ද යන ප්‍රශ්නය පමණි. මිළඟ ජනාධිපති අපේක්ෂකයා අනුර ද මහින්ද ද යන ප්‍රශ්නය ය. දුර්වල වී ඇති ආණ්ඩුව ශක්තිමත් කරගන්නේ කෙසේ ද යන්නට වඩා ජනාධිපතිනිය දන් අවධානය යොමු කර ඇත්තේ අනුරට මුදුන්න හිමිකර දීම ගැන ය. අනුර ද ඒ ලණුව කමින් ජනාධිපති සිහින දකිමින් ජවිපෙටත්, මහින්ද රාජපක්ෂටත් පහර ගසමින් ප්‍රධාන ප්‍රශ්නය අමතක කොට ඇත. අගලැබිරයා කිසිවෙකුටත් පහර නොගසුවිය ද, ඔහුට ද වැදගත් වී ඇත්තේ ආණ්ඩුව රැක ගැනීමට වඩා ජනාධිපති අපේක්ෂකත්වය ලබා ගන්නේ කෙසේ ද යන්න ය. ඇතැම් විටක ඔහු යාන්ත්‍රණ ගිවිසුම සම්බන්ධයෙන් කිසිම අදහසක් පල නොකළේ ද එනිසා විය යුතු ය.

කෙසේ හෝ වේවා මේ සියල්ලෙන් සිදුව ඇත්තේ රට අරාජික තත්වයකට පත්වීම ය. ඉබි ගමනින් සිදුවෙමින් තිබූ සංවර්ධන කටයුතු ඇණගිටීම ය. ඒකාබද්ධ යාන්ත්‍රණයෙන් සිදුව ඇත්තේ රනිල් වික්‍රමසිංහ සංවිධායකය වෙත තහවුරු කර දුන් වරදසාද හා අයිතීන් තබදරුවන් ඉදිරියට ගෙන යෑමකි. සරන් විරාම ගිවිසුමෙන් එල්ටීටීඊ සංවිධානයට මුදල් බලය සිමිවූයේ නැත. සාම සාකච්ඡා ඇය ගියේ ඒ සම්බන්ධයෙන් ඇති වූ නොසතුට සමගනි. එහෙත් යාන්ත්‍රණ ගිවිසුමෙන් මුදල් බලය ද එල්ටීටීඊ සංවිධානයට ගිම්ම තිබේ. මෙම යාන්ත්‍රණය අබණ්ඩව ක්‍රියාත්මක වුවහොත් එය එල්ටීටීඊ සංවිධානයට වෙන ම රාජ්‍යයක් ලබා ගැනීම සඳහා සහතිකයක් විම වැැැදෙන්විය නොහැක. මේ බව රටේ බහුතරයකට තේරුම් ගොස් තිබේ. එහෙත් ජනාධිපතිනියට හා මේ දිනවල ඇය වටා සිටින ගෝලබාලයන්ට තේරුම් ගොස් නැත. තේරුම් ගිය ද තම පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා තේරුම් නොගියා සේ සිටිනවා වත්තට ද පුළුවන.

වර්තමානයේ අප තරන කියන දෑට නිවැැැරදි විනිශ්චය ලැබෙන්නේ අතීතය තුළිනි. ජනාධිපතිනිය අද ගෙන ඇති හා ගනිමින් සිටින තීරණ සම්බන්ධයෙන් ඉතිහාසයේ කුණුබක්කිය මිස වෙනත් තැනක් මිම්වීමට ඉඩක් නැත. රටක්, ජාතියක්, පක්ෂයක් පාවා දී ඉතිහාසයේ කුණු බක්කියට යන්නේ ද නැතහොත් රට, ජාතිය, පක්ෂය රැකගෙන තුන්වන්වරම විරයෙක් වනවා ද යන්න තීරණය කිරීමට ඇය තවමත් ප්‍රමාද නැත. ■